ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**ජූලි 2016**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 ජූනි මාසයේ වාර්තා කළ 55.1 හි සිට 2016 ජූලි මාසයේ දී 50.6 ක් දක්වා පහළ යන ලදී. මෙහිදී, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සහ උප දර්ශකයන් මැයි මාසයට සාපේක්ෂව ජූනි මාසයේ දැක්වූ සැලකිය යුතු වර්ධනයෙන් පසුව ජූලි මාසය තුලදී මෙලෙස මන්දගාමී වී ඇත. මේ සඳහා නව ඇණවුම් සහ නිෂ්පාදන දර්ශකයන්ගේ පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, සේවා නියුක්ති සහ ගැණුම් තොග දර්ශක හැරුණු කොට, සියලුම උප දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව පහත වැටුණි. නිෂ්පාදන සහ ගැණුම් තොග දර්ශක හැරුණු කොට, සියලුම උප දර්ශක කඩයිම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50 ට වඩා අඩු අගයක් වාර්තා කළ ද, නිෂ්පාදන සහ ගැණුම් තොග දර්ශකයන් කඩයිම් මට්ටමට වඩා ඉහල අගයක පැවැතීම හේතුවෙන් සමස්ත දර්ශකය වර්ධනය විය. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 ජූනි මාසයේ දී වාර්තා කළ 56.3 හි සිට ජූලි මාසයේ දී 57.8 ක් දක්වා ඉහළ යන ලදී. පසුගිය මසට සාපේක්ෂව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අගයේ සිදු වූ මධ්‍යස්ථ ඉහළ යාම, ආර්ථික ක්‍රියාකාරකම් නොකඩවා මධ්‍යස්ථ වේගයකින් වර්ධනය වන බව පෙන්නුම් කරයි. ව්‍යාපාර ක්‍රියාකාරකම් සිව් මසක් තුළ දී සිදු වූ ඉහළම වර්ධන වේගය වාර්තා කරන ලදී. සේවා නියුක්ති උප දර්ශකය ජූනි මාසයේ දී වාර්තා වූ 51.5 ක පහළ අගයේ සිට නැවත වර්ධනය විය. මේ අතර, ජූනි මාසය සමග සැසඳීමේ දී ජූලි මාසයේ දී නව ව්‍යාපාර සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් සුළු වර්ධන වේගයන් වාර්තා කරන ලදී. එමෙන්ම, ජූනි මාසය සමග සැසඳීමේ දී ජූලි මාසයේ දී නිම කිරීමට නියමිත කාර්යයන් පහළ වැටිණි. මේ අතර මැයි මස උපරිම අගයක් වාර්තා කළ, අයකරන මිල ගණන් හි (දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන) ඉහළ යාමේ වේගය නොකඩවා දෙවන වරටත් ජූලි මාසයේ දී පහත වැටිණි.

| වර්ෂය | මාසය | නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය |
|---|---|---|---|
| 2015 | මැයි | 67.3 | 66.8 |
| | ජූනි | 57.5 | 65.0 |
| | ජූලි | 55.5 | 60.6 |
| | අගෝස්තු | 56.5 | 59.8 |
| | සැප්තැම්බර් | 53.2 | 61.7 |
| | ඔක්තෝබර් | 57.8 | 59.5 |
| | නොවැම්බර් | 54.8 | 59.3 |
| | දෙසැම්බර් | 57.9 | 60.2 |
| 2016 | ජනවාරි | 51.9 | 58.0 |
| | පෙබරවාරි | 55.3 | 59.3 |
| | මාර්තු | 60.7 | 61.6 |
| | අප්‍රේල් | 41.6 | 54.7 |
| | මැයි | 47.9 | 58.1 |
| | ජූනි | 55.1 | 56.3 |
| | ජූලි | 50.6 | 57.8 |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.